අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

| මගේ යොමුව / எனது இல. / My Ref. | ED/05/67/37/06(වා.ස්.මා.2026) | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2026.01. 23 |
|---|---|---|---|---|---|

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
ජාතික පාසල් විදුහල්පතිවරුන්
අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

**<u>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්වීම් ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු තීරණ-2026</u>**

උක්ත කරුණ සම්බන්ධව මා විසින් නිකුත් කරන ලද මාගේ සමාංක හා 2025.11.13 දිනැති ලිපිය මගින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ 2026 වර්ෂය සඳහා සිදු කරන ලද වාර්ෂික ස්ථාන මාරුවීම් තීරණ හා බැඳේ.

02. එම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සමාලෝචන කමිටුවේ තීරණ ද සහිතව සමස්ත වාර්ෂික ස්ථාන මාරුවීම් ලේඛනය මේ සමඟ ඉදිරිපත් කර ඇති අතර එය **www.moe.gov.lk** වෙබ් අඩවියේ ද පළ කර ඇත.

03. මෙම සමාලෝචන කමිටුවේ තීරණ අනුව සියලුම ස්ථාන මාරුවීම් 2026.04.07 දින සිට ක්‍රියාත්මක වේ. මෙහි නම් සඳහන් ස්ථාන මාරුවීම් ලැබූ එක් එක් නිලධාරීන්ට වෙන් වෙන් වශයෙන් ස්ථාන මාරුවීම් ලිපි මෙම අමාත්‍යාංශය මගින් නිකුත් කරනු නොලැබේ. ඒ අනුව අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට ස්ථාන මාරුවීම් වලට යටත් සියලුම නිලධරයන් අදාළ දිනයේ නව සේවා ස්ථානවල රාජකාරි භාර ගැනීමට හැකි වන සේ වර්තමාන සේවා ස්ථානයෙන් 2026.04.06 දින සේවයෙන් පසු මුදාහැරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු ලැබූ නිලධරයකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති සේවා ස්ථානයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 වගන්තිය අනුව කටයුතු කිරීමට හැකිවන පරිදි මා වෙත වාර්තා කළ යුතුය.

05. තවද වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා මාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කර ඇති ආකෘති පත්‍ර අංක - 5A සම්පූර්ණ කර 2026.02.09 දිනට පෙර මා වෙත ඉදිරිපත් කල යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කෙරෙන අභියාචනා පිළිබඳ ඉදිරි කටයුතු සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි.

නාලක කලුවැව
ලේකම්

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com